# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

## පිළිතුරු - 11 ශ්‍රේණිය I වාරය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 11 | 1 | 21 | 1 | 31 | 2 |
| 02 | 1 | 12 | 4 | 22 | 1 | 32 | 1 |
| 03 | 2 | 13 | 1 | 23 | 4 | 33 | 2 |
| 04 | 1 | 14 | 1 | 24 | 1 | 34 | 4 |
| 05 | 3 | 15 | 4 | 25 | 3 | 35 | 1 |
| 06 | 4 | 16 | 2 | 26 | 2 | 36 | 4 |
| 07 | 1 | 17 | 1 | 27 | 4 | 37 | 2 |
| 08 | 1 | 18 | 3 | 28 | 1 | 38 | 3 |
| 09 | 2 | 19 | 1 | 29 | 3 | 39 | 4 |
| 10 | 3 | 20 | 2 | 30 | 4 | 40 | 2 |

### <u>පිළිතුරු පත්‍රය 11 ශ්‍රේණිය</u>

01.

i. පැලියොතික් යුගය

ii. බෙරහඬ, ගින්දර, කොළ අතු, ගස්වල කට්ටා කැපීම

iii. 1. ප්‍රංශයේ ලැස්කෝ　　2. ස්පාඤ්ඤයේ ඇල්ටමීරා

iv. මානව සන්නිවේදනය මානව ශිෂ්ඨාචාරය සමඟ අන්‍යෝන්‍යව බැඳී බවතී. මානව සන්නිවේදනය දියුණු වූයේ මානව ශිෂ්ඨාචාරයේ දියුණු වීමත් සමඟ ය. සන්නිවේදනය සඳහා නව තාක්ෂණය හා නව ක්‍රමවේද සඳහා වූ ඉල්ලුම ඇති කරවන ලද්දේ මානව ශිෂ්ටාචාරය විසිනි.

v. සත්ත්ව සමාජය පවතින්නේ ද සන්නිවේදනය පදනම් කරගෙන ය. එහෙත් එය මානව සමාජය තරම් දියුණු නැත. මානව සන්නිවේදනය තරම් සත්ත්ව සන්නිවේදනය සංකීර්ණ හෝ දියුණු නැත. නිර්මාණශීලී ද නැත. එහෙත් සතුන් අතර ද ප්‍රබල සන්නිවේදන ක්‍රියාකාරකම් පවතී.

vi. සන්නිවේදන ක්‍රියාවලිය ආරම්භ කරන්නා සන්නිවේදකයා වේ. සන්නිවේදනය කළ යුතු දේ සැලසුම් කිරීම ඔහුගේ මූලික කාර්යයයි. මාධ්‍ය තෝරාගනු ලබන්නේ ද ඔහු විසිනි. ග්‍රාහකයා කවුරුන්දැයි දන්නේ ද සන්නිවේදකයා ය.

vii. සන්නිවේදකයා ග්‍රාහකයා බවටත්, ග්‍රාහකයා සන්නිවේදකයා බවටත් කාර්ය මාරුකර ගනිමින් ද්වි මාර්ගික සන්නිවේදනය ක්‍රියාත්මක වේ.

viii. 1. තොරතුරු සම්පාදනය　　2. අධ්‍යාපනය ලබා දීම
3. විනෝදාස්වාදය　　4. පෙළඹවීම
5. සමාජානුයෝජනය　　6. සංවාද හා සාකච්ඡා පැවැත්වීම
7. සංස්කෘතික ප්‍රගමනය　　8. සමාජ ඒකාබද්ධතාව

ix. ''කෙනෙකුගේ පංචේන්ද්‍රිය මගින් ලැබෙන විවිධ සංදේශ ග්‍රහනය කර ගෙන එය තේරුම් ගැනීම සංජානනයි''

x. 1. සංදේශය තුළ විවිධාර්ථ පැවතීම
2. වැරදි ලෙස තොරතුරු ගොනු කර සංදේශ සැකසීම
3. සන්දේශයේ තොරතුරු විකෘති වී තිබීම.
4. ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයට නොගැළපීම

02. i. 1. බ්‍රෝඩ්ෂීට්, ටැබ්ලොයිඩ්

ii. 1. පුරාතන යුගය 2. නූතන යුගය

iii. 1. සාක්ෂරතාව හා පරිකල්පනය වර්ධනය වීම.
2. තමාට කැමති පරිදි කියවිය හැකි වීම.
3. කියවීමේ රටාව පාඨකයාට තීරණය කළ හැකි වීම
4. ගබඩා කිරීමට විශේෂ පහසුකම් අවශ්‍ය නොවීම.
(මින් ලක්ෂණ තුනක් ලියවිය යුතු ය.)

iv. 1. ක්ෂණිකව පුවත් දැනගැනීමේ හැකියාව
2. නැවත නැවත කියවිය හැකි වීම.
3. තොරතුරු විෂයන් අනුව වර්ග කර පළ කොට තිබීම
4. ක්ෂණිකව පාඨක ප්‍රතිචාර දැක්විය හැකි වීම
5. ගබඩාකර තබාගැනීමේ පහසුව
6. යාවත්කාලීන කිරීමේ පහසුව

03. i. 1. රූපගත කිරීම් ශිල්පී 2. ආලෝකකරණ ශිල්පී
3. ප්‍රවෘත්ති ඡායාරූප 4. වෙළඳ දැන්වීම් ඡායාරූප ශිල්පී
5. වන සත්ව ඡායාරූප ශිල්පී 5. මෝස්තර ඡායාරූප ශිල්පී

ii. 1. සාමාන්‍ය කාච 2. දුර රූප කාච/පටු කෝණ කාච
3. පුළුල් කෝණ කාච
4. යුහුමු කාච

iii. 1. තොරතුරු රැස් කිරීම 2. ප්‍රවෘත්ති විශේෂාංග වර්ගීකරණය
3. ප්‍රවෘත්ති රචනය 4. භාෂා සංස්කරණය
5. පරිගණක අක්ෂර සංයෝජනය 6. සෝදුපත් කියවීම
7. පිටු සැකසුම 8. නැවත සංස්කරණය
9. සැකසූ පිටු සඳහා අනුමැතිය ලබා ගැනීම 10. පුවත්පත ප්‍රකාශයට පත් කිරීම

මින් තුනක් කෙටියෙන් පැහැදිලි කළ යුතු ය

iv. 1. අදහස් ප්‍රභලව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව
2. තාත්වික බව නිසා ග්‍රාහක විශ්වාසනීයත්වය දිනා ගැනීමට හැකි වීම
3. පහසුවෙන් ග්‍රාහක ආකර්ෂණය ලබා ගැනීමට හැකි වීම
4. පහසුවෙන් මුද්‍රණ තාක්ෂණය හා අනුගත වීමට ඇති හැකියාව
5. ඕනෑම අයෙකුට පහසුවෙන් තේරුම් ගැනීමට ඇති හැකියාව.

04. i. 1. වාචික 2. අවාචික 3. ශ්‍රව්‍ය

4. දෘශ්‍ය 5. ලිඛිත

ii. ප්‍රක්ෂේපණය වන,

1. ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය 2. කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය
3. ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය 4. බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය
5. අන්තර්ක්‍රියාකාරී පුවරුව

ප්‍රක්ෂේපණය නොවන,

1. කළු ලෑල්ල 2. කාන්දම් ලෑල්ල
3. පත්‍රිකා ලෑල්ල 4. පිටු පෙරළන ලෑල්ල

iii. 1. නිරවුල් බව හා පැහැදිලි බව
2. ලේඛනයට උචිත ආකෘතිය නිර්මාණශීලී බව
3. සම්මත ව්‍යාකරණ විධි භාවිතය

iv. 1. සන්දේශ පොදු වීම
2. සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවීම
3. සංවිධිත ආයතනයක් මගින් ක්‍රියාත්මක වීම
4. විශාල හා පැතිරුණ ග්‍රාහක ක්ෂේත්‍රය
5. වෘත්තීය සන්නිවේදකයින් සිටීම.
6. ඒකමාර්ගික බව
7. තාක්ෂණික උපකරණ භාවිතය

05. i. 1. අර්ථ බාධක 2. මාධ්‍ය බාධක

ii. අර්ධ බාධක

අර්ථ බාධක ලෙස හඳුන්වනු ලබන්නේ සන්නිවේදකයා විසින් එවන ලද සංදේශය ග්‍රාහකයාට ග්‍රහණය කරගත හැකි නමුත් එය ඒ ආකාරයෙන්ම අර්ථ ගැන්වීමට ග්‍රාහකයාට නොහැකි වීම සඳහා ඇති වන බාධකයි.

මාධ්‍ය බාධක

මාධ්‍ය බාධක යනු තාක්ෂණික බාධක වේ. එනම් සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා දක්වා සන්දේශ ගමන් කිරීමට යොදා ගන්නා මාධ්‍යයේ කුමන හෝ ස්ථානයක දී එම ගමනට ඇතිවිය හැකි යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන බාධකයි.

iii. දොරටුපාලකගේ කාර්ය වන්නේ යම් දොරටුවකින් එහා මෙහා යන අය පාලනය කිරීමයි. සන්නිවේදන ක්‍රියාවලියේ දී දොරටුපාලකගේ කාර්යය වන්නේ සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා දක්වා ගමන් කරන සන්දේශ පාලනය කිරීමයි. එනම් යම් යම් සන්දේශ පාලනය කිරීමේ අවශ්‍යතාව යම් යම් අවස්ථාවලදී ඇති වේ. ඇතැම් විට එය යහපත් චේතනාවෙන් කරන්නක් විය හැකිය.

iv. මෙය යුගල සන්නිවේදනය ලෙස ද හැඳින්වේ. අන්තර්පුද්ගල සන්නිවේදනයේ මූලික අවස්ථාවක් ලෙස මෙය දැක්විය හැකි ය. එමෙන්ම යමෙකුගේ දෛනික ජීවිතයේ දී ද්විපුද්ගල සන්නිවේදනයට ප්‍රමුඛ ස්ථානයක් ලැබේ. එයට හේතුව විවිධ කාර්යයන් සඳහා තවත් කෙනෙකු සමග අදහස් හුවමාරු කර ගැනීමට සිදු වීමයි. ද්විපුද්ගල සන්නිවේදනය යමෙකුගේ ජීවිතයේ සාර්ථකත්වයට අත්‍යවශ්‍ය වේ.

06. i. සකස් කරන ලද දත්ත නොහොත් කරුණු තොරතුරු නම් වේ.

ii.
1. පුද්ගල අවශ්‍යතා සපුරාලීමට
2. තීරණ ගැනීමේ ක්‍රියාවලියට
3. පුද්ගල සබඳතා ගොඩ නැගීමට
4. අධ්‍යාපන කටයුතුවලට
5. ගැටලු නිරාකරණයට
6. නිර්මාණශීලී චින්තනයට

මින් දෙකක් කෙටියෙන් විස්තර විය යුතු ය.

iii.
1. දෘඪ පුවත් - විශාල පිරිසකට බලපෑමක් ඇති කළ හැකි ජාතික හෝ ජාත්‍යන්තර වැදගත්කමක් සහිත කාලීන වටිනාකමක් ඇති පුවත් දෘඪ පුවත් නම් වේ

2. මෘදු පුවත් - සමාජයට වැඩි බලපෑමක් ඇති නොකරන එහෙත් වැඩි දෙනාගේ අවධානය හා කැමැත්ත දිනාගන්නා, මානව හැඟීම්වලට ආමන්ත්‍රණය කරන පුවත් මෘදු පුවත් වේ.

iv.
1. නිවැරදි බව
2. සමතුලිත බව
3. පැහැදිලි බව
4. විශ්වසනීයත්වය

07. i. මින් අදහස් වන්නේ ස්ත්‍රිය හා පුරුෂයා ජීව විද්‍යාත්මක වෙනස් වන බව ය. එහෙත් සමාජීය කාර්යයන් වන රැකියාව, දේශපාලනය, ආර්ථික කටයුතු, ආගමික කටයුතු, සංස්කෘතික කටයුතු හා අධ්‍යාපනය ආදියේ දී ස්ත්‍රිය හා පුරුෂයා සමානව සැළකෙන බව.

ii.
1. ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත් වීම
2. ඡන්ද අයිතිය භාවිත කිරීම
3. බදු ගෙවීම
4. නීතිගරුක වීම
5. සමාජ සුභසාධනයට කටයුතු කිරිම
6. දේශාභිමානීව කටයුතු කිරීම
7. සියලු ආගම් හා ජාතීන්ට ගරු කිරීම
8. යහපත් වෘත්තියක නියැලීම
9. ආචාරශීලී වීම හා ගුණ ගරුක වීම
10. පවුල තුළ යහපත්ව ජීවත් වීම

iii. 10 ශ්‍රේණිය පෙළ පොත 122 පිටුව

iv. 10 ශ්‍රේණිය පෙළ පොත 132 පිටුව